# චින්තනය නිදහස්වීම : බෞද්ධ දාර්ශනික ඉගැන්වීමක්

නුවන්තිකා ආරියදාස

## හැඳින්වීම

මුල් බුදුසමයෙන් අදහස් කෙරෙන්නේ චින්තනය නිදහස් වීමක් පිළිබඳ විනා චින්තනයෙන් නිදහස් වීමක් නොවේ. චින්තනයෙන් නිදහස් විය හැක්කේ මරණයෙන් පමණි. බෞද්ධ නිදහස් චින්තනය සම්බන්ධව ඉදිරිපත් කෙරෙන සුප්‍රකට පාලි මූලාශ්‍රය පිළිබඳ මාගේ කියවීමට අනුව චින්තනය නිදහස් වීම වනාහි දෘෂ්ටිග්‍රහණයෙන් තොර වීම යි. චංකී සූත්‍රයට අනුව 'මෙය දකිමි. මෙය දනිමි. මෙය ම සත්‍යය ය. අන්‍ය හිස් ය' (මජ්ඣිම නිකාය 2, 657) යන අන්තවාදයෙන් මිදීම යි. කාලාම සූත්‍රයේ සඳහන් පරිදි සාම්ප්‍රදායික ඥානමාර්ගවලින් ලැබෙන හුදු දැනුම සත්‍ය යැයි විචිකිච්චාවකින් තොරව එලෙසින් ම පිළිගැනීමෙන් වැළකීම යි. චින්තනයට ඉඩක් නැති ආගමික මූලධර්මවාදය යනුවෙන් අදහස් කරන්නේ ද මේ දෘෂ්ටිගතිකත්වය ය යන්න පොට්ඨපාද, බ්‍රහ්මජාල වැනි සූත්‍රදේශනා විමසීමෙන් පැහැදිලි වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

පාලි සූත්‍ර පිටකය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස හා මූලමධ්‍යමකකාරිකාව කෘතිය ද්විතීයික මූලාශ්‍රය ලෙස භාවිත කරමින් මූලාශ්‍රය අධ්‍යයනයක් ලෙස ඉදිරිපත් කරන මේ පත්‍රිකාවෙන් මා බලාපොරොත්තු වන්නේ බෞද්ධ නිදහස් චින්තනය වනාහි ආගමික මූලධර්මවාදය පිටු දකින සදාචාරාත්මක ඉගැන්වීමක් පමණක් නොව මුල් බුදුසමයේ ඉගැන්වෙන චින්තනය නිදහස් වීම පිළිබඳ දාර්ශනික ඉගැන්වීමක් බව තහවුරු කිරීම යි.

## දත්ත විශ්ලේෂණය

නිදහස් චින්තනය වනාහි ඕනෑම කරුණක් පිළිබඳ ස්වාධීනව සොයා බලා නිවැරදි යැයි තමන් සිතන ආකාරය පිළිගැනීම යැයි සමහරු නිර්වචනය කරති. ඊට හේතුව කාලාම සූත්‍රයෙන් එකල භාවිත වූ සම්ප්‍රදායික ඥානමාර්ග ප්‍රතික්ෂේප කර තිබීම බව මතය යි. එහෙත් හොඳින් විග්‍රහ කරන විට පෙනී යන්නේ ඥානමාර්ග ප්‍රතික්ෂේප කිරීමක් සූත්‍රයෙන් සිදු නො වන අතර චංකී සූත්‍රය, චූළහත්ථිපදෝපම සූත්‍රය, පායාසිරාජන්‍ය සූත්‍රය ආදි වූ බෞද්ධ ඥානවිභාගය ප්‍රකට කරන සූත්‍රවලින් පෙන්වා දෙන පරිදි එතෙක් භාවිත වූ ඥානමාර්ග අසම්පූර්ණ ඥානයක් හෙවත් නිවැරදි හෝ වැරදි විය හැකි ඥානයක් ලැබීමේ සම්භාවිතාවෙන් යුතු නිසා ප්‍රාමාණික වශයෙන් ගැනීම විවේචනය කරන බව යි. අනෙක් අතට කාලාම සූත්‍රයෙන් සිතන තරම් චින්තන නිදහසක් ප්‍රකාශ නො වන බවට අතැම්හු තර්ක කරති. මෙසේ අර්ථකථනය කිරීමට හේතුව යමක් වටහා ගැනීමේ දී ඒ පිළිබඳ

ලෝභ අලෝභ, දෝෂ අදෝෂ වශයෙන් කුසලාකුසල විනිශ්චයක් කිරීමට බුදුන්වහන්සේ උපදෙස් දී තිබීම බව සිතිය හැකිය. මෙ මගින් හුදෙක් ස්වයං තීරණයක් ගැනීමට අවකාශය නො ලැබීම ඒ තරම් නිදහසක් නැති බවක් ගම්‍ය කෙරෙයි. තවදුරටත් මේ බෞද්ධ පිළිවෙත දෙස බලන ඇතැම් උගත්හු කාලාම සූත්‍රය සදාචාරය කේන්ද්‍රකොටගත් ප්‍රශ්න සම්බන්ධයෙන් පමණක් ඉදිරිපත් කරන ලද දේශනාවක් බවට මත ඉදිරිපත් කරති. 'නිදහස් චින්තනය වනාහි කිසිදු බාධාවකින් තොරව යමක් වටහා ගැනීමට තමාට අවස්ථාව ඇත' යන පොදු මතයේ සිටින තාක් මෙවැනි අර්ථකථන රාශියක් ඇති විය හැකිය. මෙහි දී අප වටහා ගත යුතු පළමු කරුණ නම් බුදුන්වහන්සේ කාලාමයන්ට ඉදිරිපත් කරන ක්‍රමය වනාහි තවත් ශාස්තෘවරයෙකු පෙන්වා දෙන හුදු ඥානමාර්ගයක් නො වන බව යි. එය තමා වටහා ගන්නා සංකල්පය නිවැරදි ද නැද්ද යන්න තහවුරු කරගන්නා කායික මානසික ක්‍රියාවක් පමණි. එසේ නොවී එය බෞද්ධයන් පිළිගත් ඥානමාර්ගයක් සේ ගතහොත් වන්නේ මුලින් කී දෘෂ්ටිගත වීමේ වරදට බුදුදහම ද අයත් වීම යි. දෘෂ්ටියකින් වියුක්ත වීමට තවත් දෘෂ්ටියක් ඉදිරිපත් කරයි නම් එය ස්වයං විසංවාදයකි. අලගද්දූපම සූත්‍රයේ 'ධර්මය පවා බැහැර කළ යුතුය' (''ධම්මාපි පහාතබ්බා'', මජ්ඣිම නිකාය 1, 337) වශයෙන් පෙන්වා දී තිබීමෙන් සනාථ වන්නේ බුදුදහම පවා වරදවා ගැනීමෙන් දෘෂ්ටියක් වීමේ හැකියාවෙන් යුක්ත බව යි. තමන් වහන්සේ පිළිබඳව පවා සම්පූර්ණයෙන් සොයාබැලීමකින් තොරව පිළි නො ගත යුතු බව චූළහත්ථිපදෝම සූත්‍රයේ පැහැදිලි කරන්නේ ද ප්‍රඥාවෙන් පරීක්ෂා නොකර හුදු ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මත යමක් පිළිගැනීමේ දී වැරදි වීමේ සම්භාවිතාවෙන් යුක්ත වන හෙයිනි. විශාල ඇත් අඩියක් දැකීම නිසා විශාල ඇතෙක් ඇතැයි තීරණය කිරීම වැරදි විය හැක්කේ විශාල පාද සහිත කුරු අලින් ද වනයේ වෙසෙන බැවිනි. ඒ අනුව බුදුන්වහන්සේ කාලාමයන්ට නිර්දේශ කරන්නේ යම් ධර්මයක් ඇසීමෙන් දැකීමෙන් අනතුරුව ලැබෙන්නා වූ දැනුම ප්‍රායෝගිකව විමසා බැලීමෙන් නිවැරදි ද යන්න තමා ම තහවුරු කරගැනීමෙන් අනතුරුව නුවණැත්තන් විසින් ගර්හාවට ලක් නො කරන්නේ නම් ඒ ධර්මය පිළිපැදීමෙන් කිසිවෙකුට අනර්ථයක් නොවී යැයි තමාට ම වැටහේ නම් පිළිගත යුතු ද නැද්ද යන්න තමා තීරණය කළ යුතු බව යි. බුදුන්වහන්සේ මග්ගක්කායී (මාර්ගය පෙන්වා දෙන්නා) වන්නේ ද තමාගේ ධර්මය පිළිගන්න යැයි ශ්‍රාවකයාට ප්‍රදානය නො කර ඔහුට ම ධර්මය විනිශ්චය කිරීමට නිවැරදි මග පමණක් දේශනා කරන හෙයිනි.

බුද්ධකාලීන භාරතයේ පැවති දෙසැටක් ආගමික, දාර්ශනික මතවාදබුදුන්වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් හඳුන්වා දී ඇත්තේ 'දෘෂ්ටි'ලෙස ය. එසේ හැඳින්වීමට හේතුව ඒවා අසම්පූර්ණ ඥාන මාර්ග මත පදනම්ව අන්තවාදී මත ප්‍රකට කරන හෙයිනි. යමෙක් යමක් පිළිබඳ 'මම මෙය දනිමි' යි යැයි සිතා තෘෂ්ණාදෘෂ්ටිමාන වශයෙන් පරාමර්ශනය කිරීමෙන් එය පමණක් ම සත්‍ය වේ යැයි පිළිගත් විට ඔහු හෝ ඇය තම මතවාදය තුළ සිරගත වේ. බෞද්ධ ඥානවිභාගයට අනුව ඥානය ඇති වීම

ආරම්භ වන්නේ ස්පර්ශ ප්‍රත්‍යයෙනි (දීඝ නිකාය 1, 39). ඇස, කන ආදි වූ ආයතන සයට දැනෙන ස්පර්ශය මගින් ඇතිවන වේදනාව නිසා සංජානනය (වැටහීම/හඳුනාගැනීම) සිදු වේ. ඇසට රූප ස්පර්ශ වීමෙන් රූපය හඳුනාගනී. කනට ශබ්දය ස්පර්ශ වීමෙන් ශබ්ද හඳුනාගනී. හඳුනාගැනීම හෙවත් සංජානනය මගින් ඥානය ඇති වේ. මධුපිණ්ඩික සූත්‍රයෙන් පැහැදිලි වන පරිදි ග්‍රාහ්‍යග්‍රාහක සම්බන්ධය හා එයින් ඇති වන විඥානය යන තුන එක් වීමෙන් ස්පර්ශය සිදු වේ. යමෙක් එම ස්පර්ශායතන සයෙන් උපන් රූපාදි ස්පර්ශකොට ඇතිවන වේදනාව සංජානනය කිරීමෙන් පසු සිදුවන මානසික ක්‍රියාවලිය මගින් තෘෂ්ණාදෘෂ්ටි සහිත ප්‍රපංචයන්ගෙන් යුත් සංඥා ඇතිකර ගනියි (මජ්ඣිම නිකාය 2, 280). මේ මානව චින්තන ක්‍රියාවලිය බුදුසමය හඳුන්වන්නේ ප්‍රපංචකරණය යනුවෙනි. ඉමැනුවෙල් කාන්ට් නම් ජර්මානු දාර්ශනිකයාට අනුව බාහිර ලෝකයේ විෂය වස්තූන් පිළිබඳ අව්‍යහිත ග්‍රහණය (immediate apprehensions) දැන්වීම මනසේ ක්‍රියාකාරීත්වය වේ. සංවේදන බාහුල්‍යක් වශයෙන් ලැබෙන සංදර්ශකයන් හෙවත් සංකල්ප පොදු සංකල්පයක් බවට පත් කරන්නේ අවබෝධනය මගිනි. මනස හෙවත් අවබෝධනායතනයේ ක්‍රියාකාරීත්වය එය යි. ප්‍රපංචසංඥා හේතුවෙන් දෘෂ්ටි ආස්වාදය ඇති වීම නිසා පිළිගත් දෘෂ්ටිය කෙරෙහි ඇලීම සිදු වේ. එවිට පුද්ගලයා සිය චින්තනය මෙහෙය වන්නේ තමා පිළිගත් දෘෂ්ටියට අනුව යි. මෙයින් සිතීමේ කාර්යය ඒ දෘෂ්ටි සීමාව තුළ සිරගත වේ. නිදසුනක් ලෙස බ්‍රාහ්මණයෙකු වේද ග්‍රන්ථයක සඳහන් වන පරිදි 'ආත්මය ඇත' යන්න සත්‍ය සේ පිළිගැනීමෙන් ඔහු ශාස්වතවාදියෙක් වන්නාක් මෙනි. එසේ වීමෙන් ඔහු සංසාරය, පුනරුත්පත්තිය ආදිය විශ්වාස කිරීමට පෙළඹෙයි. නිල්පැහැ උපැස්යුවලක් පැළඳි අයෙක් තමා දකින සියල්ල නිල්පැහැයෙන් දකින්නාක් මෙනි. තමා එසේ දෘෂ්ටිග්‍රහණයකට ලක්ව ඇති බව බොහෝ දෙනා නො දන්නා අතර ප්‍රථම වරට ඒ අවිද්‍යාව පිළිබඳ පැහැදිලි කරන ලද්දේ බුදුන්වහන්සේ ය. දෘෂ්ටියකින් තොරව යථාර්ථය පසක් කිරීම සඳහා බුදුන්වහන්සේ ඉදිරිපත් කරන්නේ ප්‍රතීත්‍යසමුත්පාදය යි. එනම් සරලව ම 'මෙය ඇති කල්හි මෙය වේ, මෙය නැති කල්හි මෙය නොවේ' යනුවෙන් සිතීම යි. ඇස ප්‍රත්‍ය වීමෙන් රූපය පිළිබඳ වැටහීම ඇති වේ. ඇස නැති කල්හි රූප පිළිබඳ වැටහීමක් නැත. ජාත්‍යන්ධයෙකු සුදු, කළු වර්ණ පිළිබඳ නොදන්නේ වර්ණ හඳුනාගැනීමට අවශ්‍ය රූප ස්පර්ශය සඳහා ඇසෙහි පෙනීම නැති හෙයිනි. ප්‍රතීත්‍යසමුත්පාදීව සිතීමෙන් වන්නේ රූප දැකීම සම්බන්ධයෙන් තමා ම ප්‍රායෝගිකව විමසා බලා ඇති හෝ නැති බව කෙසේ සිදු වේ ද යන්න අවබෝධ කිරීමට හැකියාව ලැබීමක් විනා බුදුන්වහන්සේ දේශනා කළ පමණින් පිළිගැනීමක් නොවේ. එහෙයින් එමගින් දෘෂ්ටිගතික බවක් ඇති නොවේ.

පශ්චාත් බෞද්ධ දාර්ශනිකයෙකු වූ ආචාර්ය නාගාර්ජුනපාදයන් මූලමධ්‍යමකකාරිකාවේ ආර්යසත්‍ය පරීක්ෂාවෙන් පෙන්වා දෙන්නේ ද දෘෂ්ටිරහිත බව, අන්තවාදී නො වීම හෙවත් මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ශූන්‍යත්වය වනාහි

අන්කිසිවක් නොව ප්‍රතීත්‍යසමුත්පාදය බව යි. (තිලකරත්න, 2008, 152). බෞද්ධ සත්තාවාදයට (ontology) අනුව පවතිනවා යැයි පෙනෙන යමක් වේ ද ප්‍රතීත්‍යසමුත්පාදය වූ කලී ඒ පැවැත්ම පැහැදිලි කිරීම පිණිස මානසිකව ගොඩනගාගත් සිද්ධාන්තයකි. රූප දැකීම සිදු වේ. එය ඇසින් දකින බව පොදු සත්‍ය වේ. ඒ දෙක එක් වීමෙන් අප තුළ මානසික උත්තේජනයක් ද සිදු වේ යන්න පොදු වැටහීම වේ. මේ පැවැත්ම භාෂාවෙන් ප්‍රකාශ කිරීමට යම් වචනයක් අවශ්‍ය ය. ඒ වචනය ප්‍රතීත්‍යසමුත්පාදය නම් වේ. ඇස හා රූප ප්‍රත්‍ය වීමෙන් චක්ෂුර්විඥානය ඇති වේ යැයි කීමෙන් ඇස හා රූප සම්බන්ධය යථාර්ථ වශයෙන් පවතින නිත්‍ය වූ සම්බන්ධයක් බව අදහස් නො කරන හෙයින් එමගින් දෘෂ්ටියගතික බවක් ඇති නො කරයි. එහෙයින් චින්තනය නිදහස්ව තබා ගැනීමට අවකාශය සැළසෙයි. නිවන ශූන්‍ය යැයි ද නාගාර්ජුනපාදයන් පෙන්වා දෙන්නේ නිවන හෙවත් විමුක්ති ඥානය දෘෂ්ටිවලින් තොර නිසා ය. එනම් සංකල්පීය වශයෙන් චින්තනය ශූන්‍ය වීම යි.

සමාලෝචනය

චින්තන ක්‍රියාවලිය සිදු වුවත් ප්‍රතීත්‍යසමුත්පන්නව දැකීම නිසා විද්‍යාව ඇති වීමෙන් කිසිදු දෘෂ්ටියක් පිළිනොගන්නා හෙයින් ඇලී සිටීමට දෘෂ්ටියක් මනස තුළ තැම්පත් නොවේ. එවිට චින්තනය නිදහස් ය. මෙයින් තහවුරු වන්නේ බෞද්ධ නිදහස් චින්තනය යනු චින්තනය නිදහස් වීම පිළිබඳ සදාචාරාත්මක ඉගැන්වීමකට වඩා දාර්ශනික ඉගැන්වීමක් වන බව යි.

ප්‍රමුඛ පදඃ නිදහස් චින්තනය, දෘෂ්ටිග්‍රහණය, ඥානමාර්ග, ප්‍රතීත්‍යසමුත්පාදය

ආශ්‍රිත ග්‍රන්ථ

*දීඝ නිකාය.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණය.

*මජ්ඣිම නිකාය.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණය.

*සංයුත්ත නිකාය.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණය.

තිලකරත්න, අසංග. (2008). *ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.